නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය
வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் மீ ஓய
Resedent Project Management Office – Mee Oya
වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management
මී ඔය
ගල්ගමුව
மீ ஓய
கல்கமுவ
Mee Oya
Galgamuwa

මගේ අංකය / எனது இல. / 15My Ref No — 018/3/1/3

ඔබේ අංකය / உமது இல. / Your Ref No

දිනය / திகதி / Date — 2018/ 03/ 22

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියලුම
රජයේ නිලධාරි මහතුන් සියලුම ගොවි සංවිධාන
නියෝජිතවරුන් වෙත

**මී ඔය ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව 2018 - මාර්තු**

සහභාගි වූ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | D.M.K.H.දිසානායක මයා | නේ:ව්‍යා:කළමණාකරු | වාරිමාර්ගකළමනාකරණ අංශය |
| 02 | H.M.K.C.හේරත් මිය | සංවර්ධන සහකාර | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 03 | M.N.A.N.කුමාරි මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 04 | R.M.N.K.රත්නායක මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 05 | Y.G.N.අමරසිංහ මෙනවිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 06 | H.M.C.K.හේරත් මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 07 | H.L.G.G.අබේවික්‍රම මිය | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 08 | W.T.බුද්ධිරාජ් මයා | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 09 | W.A.G.P.කුමාරි මිය | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 10 | W.M.C.L.විජේකෝන් මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

සහභාගි වූ ගොවි නියෝජිතවරුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | G.M.කිරිබංඩා මයා | සභාපති | අභය ගොවි සංවිධානය |
| 02 | H.M.T.මුතුබංඩා මයා | ලේකම් | අභය ගොවි සංවිධානය |
| 03 | H.M.ජයවර්ධන මයා | සභාපති | අබ-පැරකුම් ගොවි සංවිධානය |
| 04 | R.K.ගාමිණිකොස්ගොල්ල මයා | භාණ්ඩාගාරික | අබ-පැරකුම් ගොවි සංවිධානය |
| 05 | J.A.සියාතුහාමි මයා | සභාපති | වළගම්බා ගොවි සංවිධානය |
| 06 | W.M.කුමාරපාල මයා | ලේකම් | වළගම්බා ගොවි සංවිධානය |
| 07 | A.L.M.S.නසූර්දීන් මයා | භාණ්ඩාගාරික | වළගම්බා ගොවි සංවිධානය |
| 08 | D.තාහිදු මයා | ලේකම් | ධාතුසේන ගොවි සංවිධානය |
| 09 | J.A.පබිලිස් මයා | සභාපති | ශ්‍රී විජය ගොවි සංවිධානය |
| 10 | W.V.ආරියසේන මයා | භාණ්ඩාගාරික | ශ්‍රී විජය ගොවි සංවිධානය |
| 11 | A.ඇන්සලන් අල්විස් මයා | සභාපති | යාය 02 ගොවි සංවිධානය |
| 12 | K.G.සෝමපාල මයා | ලේකම් | යාය 02 ගොවි සංවිධානය |
| 13 | S.P.විජේරත්න මයා | නියෝජිත | යාය 02 ගොවි සංවිධානය |
| 14 | R.M.H.K.රත්නායක මයා | ලේකම් | යාය 03 ගොවි සංවිධානය |
| 15 | H.H.කරුණාරත්න මයා | සභාපති | යාය 04 ගොවි සංවිධානය |
| 16 | H.M.රත්නායක බංඩාර මයා | ලේකම් | යාය 04 ගොවි සංවිධානය |
| 17 | H.A.L.කරුණාතිලක මයා | උප සභාපති | යාය 04 ගොවි සංවිධානය |
| 18 | P.M.ලීලානන්ද වීරසිංහ මයා | සභාපති | යාය 05 ගොවි සංවිධානය |
| 19 | H.M.සෝමපාල මයා | ලේකම් | යාය 05 ගොවි සංවිධානය |
| 20 | W.ආරියරත්න මයා | සභාපති | යාය 06 ගොවි සංවිධානය |
| 21 | T.B.හේරත්බංඩා මයා | සභාපති | පුරාණගම ගොවි සංවිධානය |
| 22 | B.M.C.බාලසූරිය මයා | ලේකම් | පුරාණගම ගොවි සංවිධානය |

ආගම සිහි කිරීමෙන් අනතුරු ව මී ඔය ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 මාර්තු මස 22 වන දින පෙ:ව 9:00 ට මී ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී ව්‍යාපාර කමිටු රැස්වීම පවත්වන ලදි.පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරණ ලදි.

<u>පසුගිය කමිටු වාර්තාව සමාලෝචනය හා එකගතා ලබා ගැනීම</u>

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය විය.

01.ආයතන සංවර්ධන කටයුතු- සංවර්ධන සහකාර

❖ පසුගිය මාසයේ ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | කාරක සභා පැවැත්වීම | 13 |
| 02 | මහ සභා පැවැත්වීම | 04 |
| 03 | මුදල් සාරාංශ ලබා දීම | 16 |

❖ ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත මහ සභා /කාරක සභා

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| මහ සභා පැවැත්වීම | 05 | නේ:ව්‍යා:කළ/සං:සහ/ සං:නි |
| කාරක සභා පැවැත්වීම | 16 | එම |
| මුදල් සාරාංශ ලබා දීම | 16 | එම |

- ලෝක ජල දිනය වෙනුවෙන් ඉදිරියේ දී පුහුණු වැඩසටහන් 03ක් සහ ශ්‍රමදාන වැඩසටහන් 03ක් සැලසුම් කර ඇති බවත් ඒවා සාර්ථක කරගැනීමට සහයෝගය ලබා දෙන ලෙසත් පවසන ලදි.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන ගුවන් විදුලි ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහනට සහභාගි වීම සඳහා එක් ව්‍යාපාරයකින් ගොවි සංවිධාන නිලධාරී මහතුන් 06 දෙනෙකු ඉදිරිපත් විය යුතු බවත් ඒ සඳහා සුදුසු ගොවි සංවිධාන නිලධාරී මහතුන් නම් කරගැනීම අද දින සිදු කල යුතු බවත් පවසන ලදි.

නේවාසික ව්‍යාපාර කළමණාකරු

- වර්ෂාව නොමැතිවීම හේතුවෙන් පසුගිය වසරේදී වාර්ෂිකව සිදු කල යුතු පුහුණු වැඩසටහන් ආදී සියලු දේ සිදු නොකල බවත් මෙම වසරේදී වාර්ෂිකව සිදු කල යුතු පුහුණු වැඩසටහන් සිදු කල යුතු බවත් ඒ යටතේ ප්‍රථමයෙන් සිදු කිරීමට නියමිතව ඇත්තේ ලෝක ජල දිනය වෙනුවෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් හා ශ්‍රමදාන වැඩසටහන් බවත් ඒවාට දින යෙදීම සිදුකර ඇති බවත් ඒ සඳහා සහභාගි වී වැඩසටහන සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙසත් පවසන ලදි.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

| ඉදිරිපත් කළ අය | ගැටළුව | විසඳුම |
|---|---|---|
| ගරු සභාපති පාළිකඩවල යාය 04 ගොවි සංවිධානය එච්.එච්. කරුණාරත්න මහතා | -යාය 04 ගොවි සංවිධානයේ සාමාජික නාම ලේඛණය නිවරදිව සකස් කිරීමේ අවශ්‍යතාවය මතුව ඇති බවත් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.. | -සාමාජිකත්වය පිළිබඳ ඇති ගැටළු නිරාකරණය කර සංවර්ධන නිලධාරී තුමන්ගේ සහයෝගය ද ඇතිව නිවරදි නාම ලේඛණයක් සකස් කර ගන්නා ලෙසට නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් උපදෙස් ලබා දෙන ලදි. |

❖ මීට අමතරව ඉහත සංවර්ධන සහකාර මහත්මිය විසින් දැනුවත් කරණ ලද ගුවන් විදුලි ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු ගොවි සංවිධාන නිලධාරී මහතුන් ලෙස පහත නම් සඳහන් අයවලුන් සුදුසු බවට ව්‍යාපාර කමිටුව විසින් තීරණය කරණ ලදි.

| අනු අංකය | නම | ගොවි සංවිධානය | තනතුර |
|---|---|---|---|
| 01 | P.M.ලීලානන්ද වීරසිංහ මහතා | පාළුකඩවල යාය 05 | සභාපති |
| 02 | A.ඇන්සලන් අල්විස් මහතා | පාළුකඩවල යාය 02 | සභාපති |
| 03 | G.M.කිරිබංඩා මහතා | අභය | සභාපති |
| 04 | N.P.හීන්බංඩා මහතා | දකුණු ඉවුර | සභාපති |
| 05 | J.A.පබිලිස් මහතා | ශ්‍රී විජය | සභාපති |
| 06 | A.L.M.S.නසූර්දීන් මහතා | වළගම්බා | භාණ්ඩාගාරික |

02.වාරිමාර්ග කටයුතු - ඉංජිනේරු සහකාර

අද දිනට ජලාශවල පවතින ජල තත්වය පහත පරිදි දැනුම් දෙන ලදි.

| ජලාශය | ජල මට්ටම (අඩි) | අක්:අඩි |
|---|---|---|
| අබකොළවැව | 5.8 | 1225 |
| අතරගල්ල | 3.10 | 220 |
| පාළුකඩවල | 8.10 | 1306 |

➢ ඉදිරිපත් කිරීම සඳහා විශේෂ කිසිවක් නොවන බවත් ගැටළු ඇත්නම් ඉදිරිපත් කරණ ලෙසද දැන්විය.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

| ඉදිරිපත් කළ අය | ගැටළුව | වගකීම | විසඳුම |
|---|---|---|---|
| ගරු සභාපති යාය 02 ගොවි සංවිධානය ඒ. ඇන්සලන් අල්විස් මහතා | -ගොවි සංවිධාන ඇලවල්වලට කුණු දැමීමේ ගැටළුව දිගින් දිගටම පවතින බවත් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසත් පවසන ලදි. | - වාරි:ඉංජි:/ඉංජි:සහ: ,නෝ:ව්‍යා:කළ | -එම ඇලවල්වලට දැන්වීම් දැමීම ඉදිරියේ දී සිදු කරණ බව ඉංජිනේරු සහකාර මහත්මිය පවසන ලදි. |
| ගරු ලේකම් යාය 05 ගොවි සංවිධානය එච්.එම්.සෝමපාල මහතා | -2017 වසර ට අදාල නඩත්තු මුදල් මේ වන තෙක් ලැබී නොමැති බවට පැවසිය. | - වාරි:ඉංජි:/ඉංජි:සහ | -දෙසැම්බර් 15ට ප්‍රථම ලිපි ලබා දුන් ගොවි සංවිධාන සඳහා මුදල් ලබා දුන් බවත් ඉතිරි ගොවි සංවිධාන සඳහා මුදල් ලබා දීමට ප්‍රතිපාදන නොමැති බවත් ඉංජිනේරු සහකාර මහත්මිය පවසන ලදි. |

| | | | |
|---|---|---|---|
| ගරු සභාපති අබකොලවැව පැරකුම් සංවිධානය එච්.එම් ජයවර්ධන මහතා | -අබකොලවැව ප්‍රධාන බන්ට් එකෙහි ඇති වලවල් සඳහා බොරළු දැමීම මේ වන තෙක් සිදුකර නොමැති බවට පවසන ලදි.<br>- අබකොලවැව වී වගාව සඳහා වැඩිපුර එක් ජල මුරයක් අවශ්‍ය බවට පවසන ලදි. | - වාරි:ඉංජි:/ඉංජි:සහ, නෝ:ව්‍යා:කළ | - ඉදිරියේ දී ඒ සඳහා ප්‍රතිපාදන ලැබුනහොත් බොරළු දැමීම සිදු කරණ බවට ඉංජිනේරු සහකාර මහත්මිය පවසන ලදි.<br>- වැඩිපුර ජල මුරයක් ලබා ගැනීම පිළිබඳව ව්‍යාපාර කමිටුව එකඟ විය. |

03.කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම
කෘෂිකර්ම උපදේශක - ඇහැටුවැව

- අතිරේක බෝග වගාවක් ලෙස තල වගාව සිදු කිරීම සුදුසු බවත් තල ප්‍රබේධ 04ක් පවතින බවත් ඒවා උමා,මලී,MI1,MI3,යන නම්වලින් හඳුන්වන බවත් ය.තවද තල වගාවේ වගා කාලය මාස 03ක් බවත් ඵලදාව අතින් මලී ප්‍රබේධය වඩා උචිත බවත් විශේෂයෙන් වගා කරණ පරිසරය අනුව ඵලදාව වෙනස් වන බවත් පැවසීය.
- නිකවැරටියේ උමා ,MI3 යන බීජ ප්‍රබේධ පවතින බවත් 50% දායකත්වය යටතේ කිලෝ ග්‍රෑම් 1ත් රු 225 ක් වැනි මිලකට ලබා දිය හැකි බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය වන්නේ අක්කර එකක් සඳහා තල කිලෝ ග්‍රෑම් 02ක් බවත්ය.
  ලෝක ජල දිනයට සමගාමීව නිවසේ බැහැර කරණ අපවහන ජලය ගෙවතු වගාව සඳහා යෙදීමට අවධානය යොමු කරණ ලෙසත් පැවසීය.
  ඉදිරියේදී වී වගාවේ කහ පුරුක් හානිය දක්නට හැකි වන බවත් ඒ සඳහා පළිබෝධ යෙදවීම මනා අවබෝධයකින් යුතුව සිදු කල යුතු බවත් පවසන ලදි.
  පළිබෝධ මිලදී ගැනීමේ දී අලවිසැල්වල "ඇක්ටා" ලාංඡනය සහිත නිෂ්පාදන පමණක් නීත්‍යානුකූල ඒවා බවත් මිළදී ගැනීමේදී ඒ පිළිබඳ අවධානය යොමු කල යුතු බවත් පවසන ලදි.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

- වී වගාව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ජලය නොමැති බැවින් තල වගාවකට යොමු වීම සුදුසු බවට ව්‍යාපාර කමිටු සාමාජිකයින්ගේ ද අදහස බවට පත් විය.

නේවාසික ව්‍යාපාර කළමණාකරු

- ඉතා ඉක්මනින් ගොවි සංවිධාන මහ සභාවන් පැවැත්වීමට කටයුතු කර ඒ තුලින් තල වගාව පිළිබඳ ගොවීන්ගේ අදහස් විමසා වගාවට යොමු වීම සිදු කල යුතු බව පැවසීය.

06.වෙනත්

- මාර්තු 16 වන දින වයඹ ඇළ සජීවී වැඩසටහනකට සම්බන්ධ වීමට අවස්ථාව ලැබුබවත් එහිදී තමන් විසින් ගොවීන්ට වයඹ ඇළ නැරඹීමට අවස්ථාවක් ලබා දිය හැකිද යන්න පිළිබඳ විමසූ බවත් ඒ සඳහා බස් රථයක් ලබා දීම සිදු කල හැකි බවත් ඒ සඳහා ගොවීන් 50ක් සහභාගි කරවිය හැකි බවටත් එහිදී දැනුවත් වූ බවට ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති පී.එම්.ලීලානන්ද වීරසිංහ මහතා අදහස් දක්වමින් ව්‍යාපාර කමිටුව දැනුවත් කරණ ලදි.

අද දින පවත්වන ලද ව්‍යාපාර කමිටුව සාර්ථකව පැවැත්වීම සඳහා සහයෝගය දුන් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් ප:ව 12.30ට පමණ ව්‍යාපාර කමිටුව අවසන් කළ අතර මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2018 අප්‍රේල් මස 26 වන දින පෙ:ව 9.00ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්වෙන බවටද සභාව දැනුවත් කරමින් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමන් විසින් රැස්වීමේ කටයුතු අවසන් කරණ ලදි.

නේවාසික ව්‍යාපාර කළමණාකරු
මී ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

පිටපත්:-

01.දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල :-කාදැස
02.වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :- කාදැස
03.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල :-අවශ්‍යකටයුතු සඳහා
04.ප්‍රාදේශීය ලේකම් ගල්ගමුව/අඹන්පොල/ඇහැටුවැව :-අවශ්‍ය කටයුතු සඳහා
05.ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමු :-අවශ්‍ය කටයුතු සඳහා
06.ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා
07.ගොවිජන සංවර්ධන නිලධරි ගල්ගමුව/අඹන්පොල
ඇහැටුවැව/නාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
08.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ගල්ගමුව කලාපය :-අවශ්‍ය කටයුතු සඳහා
09.සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය මහව :-අවශ්‍ය කටයුතු සඳහා
10.කෘෂිකර්ම උපදේශක පාලුකඩවල/අඹන්පොල
වන්නි ඉහලගම/ඇහැටුවැව/නාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
11.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගල්ගමුව :-අවශ්‍ය කටයුතු සඳහා